# දැන්වීමයි

## සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීම

## විශ්වවිද්‍යාල ප්‍රවේශය - 2021/2022 අධ්‍යයන වර්ෂය

## දෘශ්‍ය කලාවේදී /ප්‍රාසංගික කලාවේදී (සංගීත/නර්තන/නාට්‍ය හා රංගකලාව)

## ගෞරව උපාධි පාඨමාලා

(2021 අ.පො.ස. උ.පෙළ ප්‍රතිඵල මත)

2021 වර්ෂයේ පැවති අ.පො.ස. උසස් පෙළ පරීක්ෂණයේ ප්‍රතිඵල මත සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බවට නිවේදනය කර ඇති අපේක්ෂකයින්ගෙන්, යෝග්‍යතා පරීක්ෂණය සඳහා **2022 සැප්තැම්බර් 05** වන දින සිට අයදුම්පත් කැඳවනු ලැබේ.

01. ප්‍රවේශය සඳහා අවශ්‍ය අවම සුදුසුකම්

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති "ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල, ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය, අධ්‍යයන වර්ෂය 2021/2022 (අ.පො.ස. උසස් පෙළ විභාගය 2021)" ශිෂ්‍ය අත්පොතට අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් සපුරා ඇති

**සහ**

චිත්‍ර හා මූර්ති කලා / සංගීතය / නර්තනය / නාට්‍ය හා රංග කලාව යන විෂයයන් ගෙන් හැදෑරීමට බලාපොරොත්තු වන අධ්‍යයන පාඨමාලාවට අදාළ විෂයට 2021 අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් සහිතව පෙනීසිටි විෂයයන් තුනෙන්ම සමත්ව සිටීම.

(ii) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවශ්‍ය ඉහත කී අවම සුදුසුකම් සපුරා ඇති සිසුන් ඊට අමතරව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබීම සඳහා විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන **යෝග්‍යතා පරීක්ෂණයෙන්** ද සමත්විය යුතුය.

/ … 02

**02. අයදුම් කළ යුතු ආකාරය**

අයදුම්කරුවන් පහත සඳහන් දිගුව (link) ඔස්සේ විශ්වවිද්‍යාල විද්‍යුත් කළමණාකරණ පද්ධතිය (EMS) හි පළකර ඇති අයදුම්පත මාර්ගගත ක්‍රමයට (Online) සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.
**https://ems.vpa.ac.lk/aptitude_test_registration?id=2**

අයදුම් කල හැකි අවසන් දිනය **2022 සැප්තැම්බර් 18** වේ.

යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන්ගෙන් එක් පාඨමාලාවක් සඳහා රු.2000.00 ක ගාස්තුවක් අය කරනු ලැබේ. එම ගෙවීම සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය නමින් ලංකා බැංකුවේ නිදහස් චතුරස්‍ර ශාඛාවේ ඇති අංක 84072227 දරණ ගිණුමට බැරවන පරිදි ලංකාවේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකට හෝ විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය www.vpa.ac.lk හි Pay Online (Student Payment ⟶ 2022 Aptitude Test Fee) හරහා සිදු කල හැක. බැංකු ශාඛාවකට හෝ මාර්ගගත ක්‍රමය ඔස්සේ (Online) ගෙවීම සිදු කිරීමේදී, අයදුම්පත සම්පූර්ණ කරන විට ඔබට ලැබෙන Admission Number එක සඳහන් කිරීම අනිවාර්යය වේ. **මුදල් තැන්පතු යන්ත්‍ර (CDM) මගින් සිදු කරන ගෙවීම් වලංගු නොවේ.**

අ.පො.ස.(උ.පෙළ) සෞන්දර්ය විෂයයන් දෙකක් සඳහා පෙනී සිට එම විෂයයන් දෙකෙන්ම යෝග්‍යතා පරීක්ෂණය සඳහා පෙනී සිටීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් එම විෂයයන් දෙක සඳහන් කර එක් අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය. විෂයයන් දෙක සඳහා ගෙවීම් දෙකක් සිදු කළ යුතු අතර එහිදී එක් එක් විෂයයට ලැබෙන Admission Numbers දෙක සඳහන් කිරීම අනිවාර්ය වේ.

අයදුම්කරුවන් මෙහි සඳහන් ලේඛන වල මුල් පිටපත් විශ්වවිද්‍යාලය විසින් යම් අවස්ථාවක ඉදිරිපත් කරන ලෙස දැන්වුවහොත් ඉදිරිපත් කිරීමට සුරක්ෂිතව ළග තබා ගත යුතුය; (i) බැංකු ශාඛාවකට ගෙවීම සිදු කළේ නම් අදාල ලදුපත (ii) ජාතික හැඳුනුම්පත (iii) මාස 06 ක් ඇතුළත ලබා ගත් පැහැදිලි උඩුකය ඡායාරූපයක් (iv) 2021 අ.පො.ස උසස් පෙළ ප්‍රතිඵල ලේඛනය

**03.** අසම්පූර්ණ හෝ සාවද්‍ය තොරතුරු ඇතුළත් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එවැනි අවස්ථාවකදී අයදුම්කරුවන් විසින් ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

**04. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටින සියලුම සිසුන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අයදුම් කළ යුතුය.**

**05.** මෙම යෝග්‍යතා පරීක්ෂණය මාර්ගගත ක්‍රමයට (Online) පැවැත්වෙන අතර පරීක්ෂණයට අදාළ විස්තර සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගේ ජංගම දුරකථනයට කෙටි පණිවිඩයක් (SMS) ලෙස සහ ඔවුන්ගේ විද්‍යුත් තැපැල (e-mail) වෙත පමණක් දන්වනු ලබන අතර තැපැල් මගින් දන්වනු නොලැබේ. මෙම යෝග්‍යතා පරීක්ෂණය සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

**06.** වැඩි විස්තර සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙහි (www.vpa.ac.lk) ඇති "Aptitude Test - 2021/2022" වෙත පිවිසෙන්න. තවදුරටත් විමසීම් සඳහා සතියේ දිනවල පෙ.ව.9.00 සිට ප.ව.4.00 දක්වා 0112033710 යන අංකයට ඇමතිය හැකිය.

ලේඛකාධිකාරී,
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය,
21, ඇල්බට් චන්ද්‍රවංකය,
කොළඹ 07
2022.09.01